**මධ්‍යම පළාත් සභාව - 2015**

**-----------------------------------**

මධ්‍යම පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණනය මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ජේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 පළාත් සභා අරමුදල

(අ) පළාත් සභා අරමුදල් ගිණුම 2016 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

(ආ) අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාල 2016 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුම් පිළිබඳ විස්තර | 2015 වර්ෂයට අදාල ගිණුම් | | |
|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 34 | 34 | - |
| (ii) | ආදායම් ගිණුම් | 02 | 02 | - |
| (iii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 66 | 64 | 02 |
| (iv) | වානිජ අත්තිකාරම් ගිණුම් | 05 | 03 | 02 |
| (v) | අරමුදල් ගිණුම් | 02 | 02 | - |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් * | 04 | 04 | - |
| (vii) | අනෙකුත් අත්තිකාරම් ගිණුම් | 01 | 01 | - |
| | | 114 | 110 | 04 |
| | | === | === | == |

* කළාපිය ආර්ථික සංවර්ධන ආයතනය (REDA) 2008 සිට 2014 දක්වා ගිණුම් ඉදිරිපත් කර නැත.

2.2.2 ප්‍රතිපාදන කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 03 ක වැය විෂයයන් 06 ක් යටතේ වූ රු.9,625,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 09 ක වැය විෂයයන් 12 ක් යටතේ වූ රු.939,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වියදම් යටතේ දැක්වියයුතු රු.9,920,518 ක් වූ වියදමක් පුනරාවර්තන වියදම් යටතේ දක්වා තිබුණි.

2.2.3 අග්‍රිම ගිණුම්

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නිරවුල් නොකළ අග්‍රිම ශේෂ එකතුව රු.1,093,265 ක් වූ අතර, එය එකතුව රු.1,072,481 ක් වූ හර ශේෂයකින් හා එකතුව රු.20,784 ක් වූ බැර ශේෂයකින් සමන්විත විය. මෙම බැර ශේෂය තුම්පනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබූ අග්‍රිමයට අදාලව වැඩියෙන් පියවන ලද රු.20,784 ක් බව නිරීක්ෂණය විය.

2.2.4 ප්‍රේෂණ ගිණුම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් හා බැංකු ශේෂ තුළ ඇතුළත් වූ ගිණුම් අංක 80074310 දරන බඩු උකස් ගන්නන්ගෙන් අයකරන ගාස්තු ප්‍රේෂණ ගිණුමේ ශේෂය රු.725,100 ක් වුවත් බැංකු සනාථ කිරීම් අනුව එය රු.13,725,100 ක් වූයෙන් රු.13,000,000 ක වෙනසක් විය.

2.2.5 තැන්පත් ගිණුම්

(අ) පළාත් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ රු.462,332,378ක ශේෂයක් වූ අතර, වර්ෂ 02 ඉක්මවා තිබූ ආයතන 17 ක තැන්පත් රු.9,136,985 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් සභාවේ මූලික අරමුණුවලට පටහැනි අයුරින් රාජ්‍ය බැංකු දෙකක එකතුව රු.1,264,475,868 ක ස්ථාවර තැන්පතු පවත්වාගෙන ගොස් තිබුණි.

2.2.6 පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම්

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40 ක දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පවතින පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂ එකතුව රු.149,556,454 ක් වූ අතර, එයින් රු.63,843,182 ක් අවුරුදු 01 සිට 04 දක්වා කාලයකටද, රු.85,713,272 ක් අවුරුදු 04 සිට 24 දක්වා කාලයකටද අදාල විය. තවද විල්ගමුව කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ගෙවා වැටුප් හා වේතන යටතේ ගිණුම්ගත කර තිබූ පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් රු.6,444,000 ක් පසුව නිවැරදි කිරීමේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ හර සීමාව රු.5,135,038 කින් ඉක්මවා තිබුණි.

2.2.7 ගිණුම් නොසැසදීම්

ඒ ඒ දෙපාර්තමේන්තු වලින් ඉදිරිපත් කරන ලද ගිණුම් හා පළාත් අරමුදල් ගිණුම (පළාත් භාණ්ඩාගාර පොත්) අතර පහත දැක්වෙන පරිදි රු.16,461,141 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් විස්තරය | ඒ ඒ දෙපාර්තමේන්තුවල ගිණුම් අනුව ශේෂය | මධ්‍යම පළාත් අරමුදල් ගිණුම අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අග්‍රිම ගිණුම | 417,570 | 510,476 | (92,906) |
| පොදු තැන්පත් ගිණුම් (3) | 5,043,177 | 5,010,056 | 33,121 |
| පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම | 14,437,625 | 14,560,268 | (122,643) |
| ප්‍රේෂණ ගිණුම | 13,725,100 | 725,100 | 13,000,000 |
| ජංගම වගකීම් (ශේෂ 4 ක්) | 1,204,128 | 382,002 | 822,126 |
| ජංගම වත්කම් (ශේෂ 3 ක්) | 162,575 | 470,838 | (308,263) |
| විවිධ වගකීම් (ශේෂ 2 ක්) | 3,401,074 | 271,368 | 3,129,706 |
| එකතුව | 38,391,249 | 21,930,108 | 16,461,141 |

2.2.8 ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම

පළාත් සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ස්ථාවර වත්කම් දක්වා නොතිබූ අතර එවැනි වත්කම් ඇති බවට මූල්‍ය ප්‍රකාශන සටහන්වලින්ද හෙළිදරව් කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල වූ ජංගම නොවන වත්කම් සංචලන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.1,449,155,414 ක් වටිනා ස්ථාවර වත්කම් පළාත් සභාව සතුව තිබුණු බව තහවුරු කර තිබුණි.

2.2.9 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) උඩුදුම්බර සිද්ධාර්ථ ප්‍රාථමික විද්‍යාලය ආරම්භ කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සතු දේපල මිලදී ගැනීම වෙනුවෙන් 2010 දෙසැම්බර් 31 දින ගෙවා තිබූ රු.20,000,000 ක මුදල උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. තෙල්දෙණිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2012 ජූනි 20 දින මෙම ඉඩමේ භුක්තිය භාරගෙන තිබූ නමුත් 2015 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල ඉඩම මිලදීගෙන නොතිබුණි.

(ආ) මධ්‍යම පළාත් භාණ්ඩාගාරය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව හා කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකළ රු.686,767 ක් වූ වැන්දඹු අනත්දරු සහ විශ්‍රාම වැටුප් දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) මහනුවර පිළිකා මධ්‍යස්ථානයට ආධාර ලෙස කටුගස්තොට, මාතලේ හා ගම්පොල කලාප අධ්‍යාපන කාර්යාල වලින් අවස්ථා 03 කදී ලද එකතුව රු.64,750 ක මුදල් එම මධ්‍යස්ථානයට ලබා නොදී මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඈ) 2014 අගෝස්තු 08 සිට 2014 ඔක්තෝබර් 16 දක්වා කාලය තුල රණවිරු කොඩි අලෙවියෙන් ලද රු.48,983 ක මුදලක් රණවිරු සේවා අධිකාරිය වෙත නොයවා මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඉ) ශිල්පාභිමානී හරසර උළෙල සඳහා 2013 දෙසැම්බර් 19 සිට 2014 දෙසැම්බර් 17 දක්වා කාලය තුල ලද රු.74,425 ක මුදලක් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. එයින් රු.41,275 ක තැන්පතු වසර 2 ක් ඉක්මවා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ත්‍රි භාෂා වැඩසටහනට 2012 ජූලි 26 ලැබී තිබුණු රු.15,000 ක මුදල් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(උ) 2014 හා 2015 වර්ෂයේ නොගෙවූ මහජනාධාර හා රෝගාධාර මුදල රු.18,400 ක් ප්‍රවර්තන වර්ෂයේ වැය විෂයයට අධිභාරයක් ලෙස සටහන් නොකර ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ මාස 03 සිට මාස 14 ක කාලයක් රඳවාගෙන තිබුණි.

2.2.10 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුම් 31 කට 2016 ජූනි 30 දක්වා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තොරතුරු ඉදිරිපත් නොකිරීම

මධ්‍යම පළාත් සභා අවසන් ගිණුමේ ඇතුළත් රු.134,547,299 ක් වූ වත්කම් ශේෂ 15 ක් හා රු.1,166,840 ක් වූ වගකීම් ශේෂ 16 ක් සාක්ෂි හා තොරතුරු නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2.2.11 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පනත් | |
| (i) 2003 අංක 17 දරන පනතින් සංශෝධිත 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනත | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවයේ යෙදීසිටින නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.5,834,342 ක් වූ වැටුපට අදාල අර්ථසාධක අරමුදල් රු.1,166,968 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවා නොතිබුණි. |
| (ii) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනතේ 07 වගන්තිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාල රු.740,000 ක් වූ මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) XII වැනි පරිච්ඡේදය | මන්දාරම්නුවර ප්‍රාදේශීය රෝහලේ වෛද්‍යවරියක් නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශ ගතවී තිබූ අතර එකී කාල සීමාව සඳහා ඇයට වැටුප් හා අතිකාල දීමනාද ගෙවා තිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය | උපලේඛනගත නිවාසවල පදිංචිවීමට හිමිකමක් ඇති නිලධාරියකුගේ වැටුපෙන් සියයට 10 ක නිවාස කුලී අයකරගත යුතු වුවද පට්ටියපල්ලේගම රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරීගෙන් 2014 ජනවාරි සිට 2015 ජුනි දක්වා කාලයට අදාළව රු.50,148 ක නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. |
| (iii) XIX වන පරිච්ජේදයේ 5.6 ජේදය | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව හා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවකින් තොරව නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් නිල නිවාස 105 ක් සඳහා නිශ්චිත නිවාස කුලියක් අයකර තිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | XXIV වැනි පරිච්ඡේදයේ 11:9:1 | ගලේවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.675,200 ක දේපල ණය සම්බන්ධ ඔප්පු හා ඇටෝර්නි බලය පැවරීමේ ලියවිලි ලබාගෙන නොතිබුණු අතර, ණය අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. |

(ඇ) මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මූ.රී.2.1 හි සඳහන් පළාත් සභා පනතේ 19 වන වගන්තියේ (ඇ) ජේදය | පළාත් සභාවේ සියලු ලැබීම් පළාත් සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු වුවත් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවත්වා ගෙනයනු ලබන ආපන ශාලාවෙන් ලැබෙන ආදායම් එම අරමුදලට බැර නොකර සුභසාධක සංගමයට රැස්කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව 2015 ඔක්තෝබර් මාසය දක්වා එසේ රැස්කර තිබුණු ආදායම රු.149,900 ක් විය. |
| (ii) | මූ.රී. 41 | මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක 2015 වර්ෂයේ පළාත් සභා ආදායම් වෙනුවෙන් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. |
| (iii) | මූ.රී. 54 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හානි වූ වාහන 20 ක් සම්බන්ධයෙන් අලාභයට අදාළ මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) | මූ.රී. 54.5 හා 54.6 | හැටන් අධ්‍යාපන කලාපයට අයත් පාසැල් 50 ක 2009 – 2013 දක්වා වර්ෂවල සිදු වී ඇති හානි හා පාඩු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් හා පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (v) | මූ.රී. 64.2.2(ආ) | ඉකුත් වර්ෂයට අදාළ ගෙවීම් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමේදී නිසි අධිකාර බලයලත් නිලධාරියෙකුගේ සහතිකය ලබාගත යුතු වුවද, එවැනි සහතිකයකින් තොරව නුවරඑළිය නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අවස්ථා 10 කදී රු.927,654 ක මුදලක් ගෙවා තිබුණි. |
| (vi) | මූ.රී. 85 | ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.891,632 ක් වටිනා ගෙවීම් වවුචර් 04 කට අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (vii) | මූ.රී. 116.1 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක එළදා/ වාර්ෂික/ දිර්ඝකාලීන බදු, වාහන හා සුරාබදු හිඟ ආදායම් රු.2,027,178 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (viii) | මු.රී.164 | මධ්‍යම පළාත් සභා ලේකම් කාර්යාලය විසින් රාජ්‍ය දැව සංස්ථාවෙන් කාර්යාල උපකරණ සපයා නොතිබියදීත් 2015 දෙසැම්බර් 31 දින රු.385,000 ක චෙක්පතක් ලියා 2016 මාර්තු 31 දින වනවිටද අදාළ භාණ්ඩ නොලැබීම හේතුවෙන් අතරඳවාගෙන තිබුණි. |
| (ix) | මු.රී. 169.1 | සියළු ගෙවීම් වවුචර් සහතික කරන නිලධාරියා විසින් සහතික කළයුතු වුවත් නුවරඑළිය නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ රු.1,229,456 ක් වටිනා වවුචර් 04 කට සහ විල්ගමුව, ලග්ගල හා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රු.3,945,039 ක් වටිනා වවුචර් 34 කට සහතික කිරීමකින් තොරව ගෙවීම් සිදු කර තිබුණි. |
| (x) | මු.රී. 188.2.2 | මධ්‍යම පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නොගෙවූ වැටුප් අධිභාර ගිණුමට, පළාත් ආදායම් ගිණුමට හෝ වෙනත් නියමිත ගිණුමකට බැර කළ යුතු වුවද, නිලධාරීන් 28 දෙනෙකුගේ රු.779,419 ක් වටිනා නොගෙවූ වැටුප් තැන්පත් ගිණුමට බැර කර තිබුණි. |
| (xi) | මු.රී. 261.2.2 | තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය අවසන් වූ වහාම පියවිය යුතු වුවද මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අවස්ථා 76 කදී නිකුත් කළ රු.1,071,743 ක අතුරු අග්‍රිම මාස 01 සිට මාස 10 දක්වා කාලයක් ගත වී තිබුණද පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (xii) | මු.රී. 365.3 | අත්තිකාරම් ගිණුම් කටයුත්ත සඳහා වූ ප්‍රාග්ධන වියදම් සියල්ලම වැය ශීර්ෂවල ප්‍රතිපාදනවලින් දැරියයුතු වුවත් ගුරුදෙණිය අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ 2015 වර්ෂයට අදාළ රු.748,731 ක ප්‍රාග්ධන වියදම් වාණිජ අත්තිකාරම් ගිණුමින් දරා තිබුණි. |
| (xiii) | මු.රී. 369.4 | ගුරුදෙණිය අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ අංක 552202 දරන වාණිජ අත්තිකාරම් ගිණුමෙහි විසර්ජන ප්‍රඥප්තියෙන් බලයදී තිබුණු රු.4,525,000 ක් වූ උපරිම වියදම් සීමාව රු.2,055,413 කින් ඉක්මවා තිබුණු අතර අංක 550202 සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුමේ වියදමේ උපරිම සීමාව උපචිත වියදම් ගැලපූ පසු රු.237,666 කින් ඉක්මවා තිබුණි. |
| (xiv) | මු.රී. 471.1 | ආයතනවලට ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතට ඇතුළත් කළයුතු වුවද පට්ටිය පල්ලේගම රෝහල වෙත ඉන්වොයිස් 13 කින් ලැබී තිබූ රු.1,055,115 ක් වටිනා |

| | |
|---|---|
| | ඖෂධ වර්ග 115 ක්ද, උඩගම අටබාගේ රෝහල වෙත එක් ඉන්වොයිසියකින් ලැබී තිබූ රු.317,109 ක් වටිනා ඖෂධ වර්ග 71ක් හා නාවලපිටිය දිස්ත්‍රික් රෝහල විසින් අවස්ථා 15 කදී මිලදීගෙන තිබූ රු.741,154 ක් වටිනා කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය අයිතම 23 ක් තොග පොත්වලට ඇතුළත් කර නොතිබුණි. |
| (xv) මූ.රී. 471.2 | ලැබෙන සියළුම තොග ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි ගණන් තැබිය යුතු වුවද, වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා 18 ක ඖෂධ තොග ලැබීම් හා නිකුත් කිරීම් ලේඛණගත කර නොතිබුණි. |
| (xvi) මූ.රී. 476 | සියළු දෙපාර්තමේන්තුවල වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය සිදු කල යුතු වුවත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් රෝහල් ගබඩා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හා වෙනත් ඒකක 233ක් අතරින් 225ක සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි |
| (xvii) මූ.රී. 477.2.1 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අධිභාරයන් අයකර ගැනීමට සමීක්ෂණය ඇරඹී දින සිට තෙමසක් ඇතුළත ක්‍රියා කළ යුතු වුවද, 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 03කට අයත් පාසැල් 37ක් සම්බන්ධයෙන් තක්සේරු වාර්තා ලබාගෙන 2016 ජනවාරි මස වන විටත් අධිභාරයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) වක්‍රලේඛ හා ලිපි

| | |
|---|---|
| (i) 1987 ජනවාරි 05 දිනැති අංක කේ/857 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයේ නිවාස සඳහා අයකරන කුලිය වාර්ෂිකව තක්සේරු කළ යුතු වුවත්, වලපනේ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් රජයේ නිවාස 20 ක් සඳහා 2011 සහ ඊට පෙර වර්ෂවල දී තක්සේරු කරන ලද කුලිය දිගින් දිගටම අය කෙරෙමින් පැවතුණි. |
| (ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම මාස 06 කට වරක්ම රජයේ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත් නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 31 ක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (iii) 1996 මාර්තු 15 දිනැති අංක 8/96 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධනය කර ඇති ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 10.4 උප වගන්තිය | මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 10 කදී වසර 10 ට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන් වෙත ලබාදී තිබුණු රු.1,404,811 ක ආපදා ණය වෙනුවෙන් වලංගු ඇපකරයකට එළඹ නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 2014/25 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | i. අඛණ්ඩව දින 180ක සේවය සම්පූර්ණ කර නොතිබුණු සේවකයන් 73 දෙනෙකු ස්ථිර සේවයට බඳවාගෙන මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.26,553,642ක වැටුප් ගෙවා තිබුණි.<br><br>ii. 2014 ඔක්තෝබර් 24 දිනෙන් පසුව පළාත් රාජ්‍ය සේවය සඳහා තාවකාලික, අනියම්, ආදේශ, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගත හැක්කේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් වුවද එවැනි අනුමැතියකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියට සේවකයින් 14 දෙනෙකු බඳවාගෙන තිබුණි. |
| (v) | භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ IAI /2002/02 දරන චක්‍රලේඛය | පරිගණක යන්ත්‍ර මිලදී ගැනිමේ සිට භාරකාරිත්වය, නඩත්තුව, අලුත්වැඩියා කිරිම සහ අපහරණයේදී අයථා පරිහරණය වැලැක්වීම සඳහා පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද, නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 156 ක හා කලාප කාර්යාලය සතු පරිගණක සම්බන්ධයෙන් එවැනි ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (vi) | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ 1979 මැයි 23 දිනැති පොදු චක්‍රලේඛ අංක 999, 06 ඡේදය | ආහාර වටය ප්‍රතිකාරයේ කොටසක් වශයෙන් සලකා එකී ආහාර අනිවාර්යෙන්ම රෝගීන් වෙත සැපයිය යුතු වුවද, ඇතැම් අවස්ථාවලදී වෛද්‍යවරුන් විසින් නිර්දේශිත ආහාර සපයා නොතිබුණු අතර නිර්දේශිත ප්‍රමාණයට වඩා අඩුවෙන් සහ නුසුදුසු තත්ත්වයේ ආහාර සපයා තිබුණි. ඒ අනුව රෝගී සත්කාරක සේවයේ අපේක්ෂිත අරමුණු නිසි පරිදි ඉටු නොවන බව නිරීක්ෂණය විය. |
| (vii) | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 1999 මාර්තු 17 දිනැති චක්‍රලේඛය | සෙනසුරාදා දිනයන්වල වෛද්‍යවරයකුගේ සාමාන්‍ය රාජකාරී වේලාව පෙ.ව. 8.00 - මධ්‍යහන 12 දක්වා වුවද කරන ලද නියදි පරීක්ෂණයට අනුව පට්ටියපල්ලේගම දිසා රෝහලේ අවස්ථා 10 කදී සෙනසුරාදා දිනවල බාහිර ප්‍රතිකාර සිදුකර නොතිබුණි. |
| (viii) | අංක මුදල්/01/2001 හා 2001 මාර්තු 28 දින දරන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛයෙහි 06 ඡේදය | i. යම් පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ මන්ත්‍රීධූරය අහෝසි වන අවස්ථාවකදී පළාත් සභාවට අයවියයුතු සියලුම ණය මුදල් එකවර සම්පූර්ණයෙන් අයකර ගැනීමට පළාත් සභාව පියවර ගතයුතු වුවද මන්ත්‍රීධූර අහෝසි වූ පළාත් සභා මන්ත්‍රීවරු 17 දෙනෙකුට අදාලව රු.3,709,173 ක් වූ ණය අත්තිකාරම් එලෙස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව ඉන් 5 දෙනෙකුගේ ණය ශේෂ මාසික වාරික වශයෙන් අයකර ගනිමින් පැවති අතර අනෙකුත් 12 දෙනාගේ ණය ශේෂ මාස 03 සිට මාස 111 දක්වා වූ කාල පරාසයක අයනොවී පවතින බව නිරීක්ෂණය විය. |
| | | ii. මූලික වැටුපෙන් අඩුකරගත හැකි වූ සියයට 40 උපරිම ණය සීමාව නොසලකා සියයට 69 ක වාරික මුදලක් අයවන ලෙසට මන්ත්‍රීවරුන් 04 දෙනෙකු සඳහා ණය අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. |
| | | iii. අත්තිකාරම් ලබාදීමේදී ඇපකරුවන් වශයෙන් ආදායම් බදු ගෙවනු ලබන පුද්ගලයෙකු හා මන්ත්‍රීවරයෙකු වශයෙන් දෙදෙනෙකු ඇපවියයුතු වුවත් ඊට පටහැනිව මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඇපකරුවන් වශයෙන් පිළිගෙන අවස්ථා 03 කදී රු.1,350,000 ක අත්තිකාරම් ලබාදී තිබූ අතර බහුමාන සහතිකද ලබාගෙන නොතිබුණි. |
| (ix) | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2003 මාර්තු 20 දිනැති අංක 04/2003 හා 2008 අගෝස්තු 20 දිනැති අංක 04/2008 දරන චක්‍රලේඛ | දඹුල්ල, විල්ගමුව, නාඋල, අඹන්ගඟ කෝරලේ හා ලග්ගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල ඉඩම් කැබලි 5ක් අනවසරයෙන් අල්ලාගෙන තිබුණද එම ඉඩම්වල අයිතිය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (x) | 2008 සැප්තැම්බර් 09 දිනැති අංක 2008/37 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40 ට සීමා කළයුතු වුවත් ගලේවෙල කලාපයේ තිත්තවැල්ගොල්ල කණිෂ්ඨ විද්‍යාලයේ 2 ශ්‍රේණියේ සිට 4 ශ්‍රේණිය දක්වා පන්ති වල එම සීමාව ඉක්මවා ළමුන් 139 දෙනෙකු ඇතුළත් කර තිබුණි. |
| (xi) | 2013 නොවැම්බර් 28 දිනැති අංක 7/2013 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය 13:4 වගන්තිය | ගලේවෙල කලාපයේ ගලේවෙල ප්‍රාථමික විද්‍යාලයට අවස්ථා 24 කදී ලැබී තිබුණු පරිත්‍යාග (ගොඩනැගිලි ඉදිකිරීම්, උපකරණ ලැබීම්) පරිත්‍යාග ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |
| (xii) | 2014 දෙසැම්බර් 31 දිනැති අංක FC/03/03/2014 දරන මුදල් කොමිෂන් සභා ලේකම්ගේ චක්‍රලේඛය | ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් පරිපාලන වැය දැරීම නොකළ යුතු බව අවධානය කර තිබියදී, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා, ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය හා ඊට අයත් දෙපාර්තමේන්තු වෙත වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් රු.3,485,113 ක පරිපාලන වියදම් දරා තිබුණි. |

| | | |
|---|---|---|
| (xiii) | 2015 සැප්තැම්බර් 30 දිනැති අංක 2005/29 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | ගලේවෙල කලාපයේ තිත්තවැල්ගොල්ල කණිෂ්ඨ විද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන ඒකකය පාසල් වේලාව තුළ හා පාසල් වේලාවෙන් පසුව ප්‍රයෝජනයට ගත හැකි වුවත් පාසල් වේලාවෙන් පසුව අධ්‍යාපන කටයුතු සඳහා හෝ විෂය බාහිර කටයුතු සඳහා පන්ති නොපැවැත්වීම හේතුවෙන් එම මධ්‍යස්ථානයෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන නොතිබුණි. |
| (xiv) | 2006 අගොස්තු 14 දිනැති අංක ජීපිසී/02/01/26 දරන මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ චක්‍රලේඛය | අනුමත රේටයන් ඉක්මවා විනිශ්චය මණ්ඩල දීමනා ලෙස රු.149,450 ක්ද, ගුණාත්මක අධීක්ෂණ දීමනා ලෙස රු.8,200 ක්ද, ආහාරපාන ගාස්තු ලෙස රු.86,635 ක්ද, වශයෙන් එකතුව රු.244,285ක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. |
| (xv) | 2003 අප්‍රේල් 11 දිනැති අංක සිපිසි/සීඑස්/06/06/02 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය | මුදල්, මුද්දර, දේපල, ගබඩා ආදියේ භාරකාරත්වය දරන, චෙක්පත් අත්සන් කරන වවුචර් සහතික කරන ආදී වගකීම් දරන නිලධාරින් 56 දෙනෙකුගෙන් ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඉ) වෙනත්

| | |
|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.4.3 | ගිවිසුම් කාලය අවසන් වූ පසු නැවත ප්‍රසම්පාදන කැඳවීමකින් තොරව කාලය දීර්ඝ කරමින්, ආරක්ෂක සේවය සපයන ආයතනයක් වෙත රු.4,325,570ක් ද කුලී පදනම මත මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය සඳහා යොදවා ගනු ලැබුණු ටිපර් 05ක් හා කැබ් රථ 08ක් සඳහා රු.2,950,458ක මුදලක් ද ගෙවා තිබුණි. |

## 3 ආදායම් හා වියදම් කළමනාකරණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විචලනයන් සහිත සාරාංශයක් පහත දැක්වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය හිතකර/ (අහිතකර) | අයවැයගත | තථ්‍ය | විචලනය හිතකර/ (අහිතකර) |
| පළාත් සභා විෂයයන්ට අදාල ආදායම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු ආදායම් | 5,217,954,000 | 5,339,455,572 | 121,501,572 | 4,627,651,000 | 4,693,017,027 | 65,366,027 |
| බදු නොවන ආදායම් | 427,046,000 | 775,598,087 | 348,552,087 | 597,349,000 | 592,421,145 | (4,927,855) |
| රජයේ ප්‍රදාන | 29,092,595,473 | 27,469,565,814 | (1,623,029,659) | 28,005,885,000 | 21,824,216,131 | (6,181,668,869) |
| එකතුව | 34,737,595,473 | 33,584,619,473 | (1,152,976,000) | 33,230,885,000 | 27,109,654,303 | (6,121,230,697) |

3.1 වියදම්

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| වියදම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පෞද්ගලික පඩිනඩි | 23,254,551,734 | 23,076,321,845 | 178,229,889 | 18,063,219,641 | 17,367,281,382 | 695,938,259 |
| අනෙකුත් | 5,393,847,079 | 4,921,696,483 | 472,150,596 | 4,781,496,965 | 4,294,165,994 | 487,330,971 |
| පුනරාවර්තන | 28,648,398,813 | 27,998,018,328 | 650,380,485 | 22,844,716,606 | 21,661,447,376 | 1,183,269,230 |
| ප්‍රාග්ධන | 4,799,644,002 | 3,787,923,779 | 1,011,720,223 | 6,000,967,683 | 4,565,578,175 | 1,435,389,508 |
| එකතුව | 33,448,042,815 | 31,785,942,107 | 1,662,100,708 | 28,845,684,289 | 26,227,025,551 | 2,618,658,738 |

3.2 හිඟ ආදායම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හා ඉකුත් වර්ෂ දෙකක අවසානයට හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2015 | 2014 | 2013 |
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 454,225,533 | 174,534,606 | 206,139,354 |
| බදු නොවන ආදායම | - | 1,607,951 | 1,961,816 |
| එකතු හිඟ ආදායම | 454,225,533 | 176,142,557 | 208,101,170 |

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුමෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 27 ක හිඟ මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තුවල එකතුව රු.55,745,491 ක් ලෙස දක්වා තිබුණද මධ්‍යම පළාත් සභාවෙන් වෙනත් පළාත් සභා වලට මාරුවී තිබූ වාහන හඳුනාගෙන ඉවත් කර නොතිබීම හේතුවෙන් එම හිඟය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) පළාත් මූල්‍ය රීති 76.1.7 ප්‍රකාර දීර්ඝකාලීන බදුකරුවන් නියමිත දිනට බදු නොගෙවීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාරව අයවියයුතු සියයට 10 දඩ මුදල වූ රු.638,600 ක මුදලක් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි.

4. මූල්‍ය සමාලෝචනය

4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.25,670,888,448 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,941,587,379 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,729,301,069 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

5. අධිකාරි ගිණුම්

පළාත් සභාව යටතේ සංස්ථාපිත අධිකාරි සහ වෙනත් ආයතනවලට අදාළ ගිණුම් අරමුදල් ගිණුම මඟින් ආවරණය නොවන බව ගිණුම් ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරන ලද අංක 01 දරන ගිණුම් ප්‍රතිපත්තිය යටතේ දක්වා තිබුණි. එසේ වුවද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් රු.357,372,007 ක පුනරාවර්තන වියදම් හා රු.297,297,514 ක ප්‍රාග්ධන වියදම් වශයෙන් එකතුව රු.654,669,521 ක් ශීර්ෂ අංක 570 යටතේ පළාත් අරමුදල් ගිණුම යටතේ දරා තිබුණි.

6. මෙහෙයුම් සමාලෝචනය

6.1 කාර්ය සාධනය

6.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ප්‍රභවය | ලැබී තිබූ ප්‍රතිපාදනය | වියදම | උපයෝජනය ඌන/ (අධි) |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i. | උපමාන පාදක ප්‍රදාන | 380,000,000 | 299,978,803 | 80,021,197 |
| ii. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,510,000,000 | 1,003,204,099 | 506,795,901 |
| iii. | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්) | 13,134,550 | 15,564,699 | (2,430,149) |
| iv. | පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 1,254,689,125 | 1,255,045,274 | (356,149) |
| v. | පාකිස්තානු ආධාර | 2,174,025 | 2,174,024 | 1 |
| vi. | මූලික සමාජ සේවා දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 27,700,000 | 27,416,052 | 283,948 |
| vii. | වෙනත් ප්‍රදාන | | | |
| | ලෝක බැංකු ආධාර - අධ්‍යාපන | 313,519,194 | 484,019,779 | (170,500,585) |
| | සෞඛ්‍ය | 355,000,000 | 527,480,513 | (172,480,513) |
| viii. | රේඛීය අමාත්‍යාංශ හා ආයතන ප්‍රදාන | 71,237,919 | 71,237,919 | - |
| | එකතුව | 3,927,454,813 | 3,686,121,162 | 241,333,651 |

6.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහාවූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අඛණ්ඩ වැඩ වෙනුවෙන් රු.මිලියන 1,770.78 ක ඇස්තමේන්තු අගයකට වූ වැඩ යෝජනා 6159 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | විස්තරය | නව වැඩ | අඛණ්ඩ වැඩ | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | | | රු.මිලියන |
| i. | සම්පූර්ණයෙන් නිම කළ | 5,711 | 11 | 5,722 | 1,668.95 |
| ii. | 50% කට වඩා අඩුවෙන් නිම කළ | 270 | 05 | 275 | 23.85 |
| iii. | 50% කට වඩා වැඩියෙන් නිම කළ | 23 | 69 | 92 | 72.10 |
| iv. | ආරම්භ කර නොතිබූ | 67 | - | 67 | 3.18 |
| v. | මතභේදයට තුඩුදෙන/ ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 3 | - | 3 | 2.70 |
| | එකතුව | 6,074 | 85 | 6,159 | 1,770.78 |

6.1.3 විභාග ප්‍රතිඵල

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ 5 ශිෂ්‍යත්ව විභාගය සඳහා මුළු දිවයිනෙන් පෙනී සිටි සිසුන් 333,672 අතුරින් මධ්‍යම පළාතට අයත් කලාප අධ්‍යාපන කාර්යාල 15 ක් යටතේ ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව 43,000 ක් විය. ඉන් කඩඉම් ලකුණු ඉක්මවා සමත් සිසුන් සංඛ්‍යාව 2,834 ක් වූ අතර එය විභාගයට පෙනී සිටි මධ්‍යම පළාතේ සිසුන්ගෙන් සියයට 6.59 ක් විය. ඉකුත් වර්ෂයේ මෙම විභාගය සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 43,595 ක් වූ අතර සමත් සංඛ්‍යාව 4,891 වූ සියයට 11.22 ක ප්‍රතිශතයක් විය. මේ අනුව ශිෂ්‍යත්ව ප්‍රතිඵල ඉකුත් වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි සියයට 4.63 ක පසු බෑමක් තිබුණි.

(ආ) ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත් වූ සිසුන් අතුරින් ලකුණු 70ට අඩුවෙන් ලබාගත් සිසුන්ගේ ප්‍රතිශතය සියයට 26.8 ක් වූ අතර කලාප වශයෙන් සැලකූ කල නුවරඑළිය කලාපයේ මෙම ප්‍රතිශතය සියයට 41.58ක් විය. මහනුවර හැර අනෙකුත් සියළුම කලාපවල මෙම ප්‍රතිශතය සියයට 20 ඉක්මවා තිබුණි. මේ අනුව 70ට අඩු ලකුණු ලැබුණු සිසුන් 11,538ක ප්‍රමාණයක් 06 ශ්‍රේණියේ ඉගෙනුම ලැබීමට අවශ්‍ය සාධන මට්ටමට ලගාවී නොතිබුණි.

(ඇ) මධ්‍යම පළාතේ කලාප 15ක් අතුරින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත් ප්‍රතිශතය සියයට 75 ඉක්මවා තිබුනේ මහනුවර කලාපයේ පමණක් වන අතර විල්ගමුව, නුවරඑළිය, ගම්පොළ හා හැටන් කලාපයන් හි අසමත් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 45.03, 43.26, 40.18 හා 40.04 ක් විය. ඉතිරි කලාප 10 හි අසමත් ප්‍රතිශතය සියයට 25 ඉක්මවා තිබුණි. තවද සිසුන් 1,133ක් එනම් සියයට 3.27ක් සියළුම විෂයයන් අසමත්ව තිබුණි.

(ඈ) 2015 වර්ෂයේ අ.පො.ස(සා.පෙළ) විභාගය සඳහා මධ්‍යම පළාතෙන් ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව 34,652 ක් වූ අතර ඉන් අ.පො.ස(උ.පෙළ) විභාගය සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව 23,209 ක් හෙවත් සියයට 66.98 ක් විය. දිවයිනේ සමස්ථ ප්‍රතිඵල අතුරින් මධ්‍යම පළාත 05 වන ස්ථානයට පත්ව තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ අ.පො.ස(උ.පෙළ) විභාගය සඳහා මධ්‍යම පළාතෙන් ඉදිරිපත් වූ සිසුන් 26046 දෙනෙකුගෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 15967ක් හෙවත් සියයට 59.38 ක් විය.

6.1.4 අනෙකුත් කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ඉටුකිරීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේදී රු.20,332,587,037 ක් වැය කර තිබූ අතර ඉන් රු.16,442,083,231ක් පළාත් සභා වැය විෂයයන් යටතේ ද, රු.3,636,277,649 ක් මධ්‍යම රජයේ ප්‍රතිපාදන යටතේද, වැය කර තිබුණි. මීට අමතරව දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (TSEP) යටතේ රු.222,311,356 ක්ද, අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) යටතේ රු.20,621,976 ක්ද, යුනිසෙෆ් ව්‍යාපෘතිය යටතේ රු.10,439,611 ක්ද, නැනෝදා වැඩ සටහන යටතේ රු.134,599 ක්ද, පකිස්තානු ආධාර යටතේ රු.718,615 ක්ද ලෙස වැයකර තිබුණි. එසේ වුවත් විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා විෂයානුබද්ධ ප්‍රතිඵල සමාලෝචනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගත් බවට සාක්ෂි නොවීය.

(ආ) දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසැල් පද්ධතිය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියට අධ්‍යාපන සංවර්ධන ලෝක බැංකු ප්‍රතිපාදන යටතේ 2015 වර්ෂය සඳහා වාර්ෂික හා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.492,070,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඉන් සියයට 29.53 ක් වූ රු.145,349,047 ක් ඉතිරිව තිබුණි. වියදම් කළ මුදලට අදාළව භෞතික කාර්ය සාධන වාර්තාවක්ද පිළියෙල කර නොතිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝකාලීන බදු පදනම මත පුහුණු ආයතනයකට වාණිජ කටයුතු සඳහා බදුදී තිබූ ඉඩමෙහි බදු කාලය 2010 වර්ෂයෙන් අවසන් වුවද එම බදු ගිවිසුම අළුත් කිරීමට හෝ ඉඩම පවරා ගැනීමට කටයුතු නොකිරීමෙන් වසර 05 කට අධික කාලයක් බදු මුදල් හිඟව පැවතුණි.

(ආ) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඇටවරාහේනේ පිහිටි ආයතනයක් සඳහා වර්ෂයකට රු.17,100 බැගින් වසර 30 ක දීර්ඝකාලීන බදු ගිවිසුමක් යටතේ බදුදී තිබූ ඉඩමෙහි බදු කාලය 2016 මාර්තු 25 දිනෙන් අවසන් වීමට තිබුණද 2006 වර්ෂයෙන් පසු කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඇ) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් හෙට්ටිපොල නව ව්‍යාපාරිකයන් හා පදිංචිකරුවන් 17 කට ලබාදී තිබූ ඉඩම්වලින් කිසිදු බදු මුදලක් අයවී නොතිබුණි. 2001 වර්ෂයේ මෙම ඉඩම් තක්සේරු කර ඇතත් වර්ෂ 15 ක කාලයක් තුළ ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයේ ඉඩම් කැබලි 09 ක් කෘෂිකාර්මික, වාණිජ හා නේවාසික ලෙස දීර්ඝකාලීනව බදුදීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයට ලැබියයුතු ආදායම් අහිමිවී තිබුණි.

(ඉ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් රු.124,700 ක් වටිනා උපකරණයක් ඇනවුම් කර වසරකට අධික කාලයක් ගතවී ඇතත්, එම උපකරණය සැපයීමට අදාළ සැපයුම්කරු අපොහොසත් වී තිබුණි.

(ඊ) ටිකිරි සෙවන ළමා නිවාසයේ ළමුන් 45ත් 50ත් අතර ප්‍රමාණයක් නේවාසිකව සිටියද ඔවුන් සඳහා ලබාදී තිබුණේ ඇඳන් 10 ක් හා තොට්ලි 31 ක් පමණක් බැවින් ළමුන් සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීමට කටයුතුකර නොතිබුබව නිරීක්ෂණය විය.

(උ) ගලගෙදර දිසා රෝහල වෙත Gluco meter යන්ත්‍රයක් නොමැතිව තිබියදී රු.80,000 ක් වටිනා blood glucose shripes 2000 ක් ලබාදී තිබුණි.

(ඌ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් මධ්‍යම පළාත් සභා සංකීර්ණය සඳහා විදුලි ජනක යන්ත්‍ර 02 ක් සපයා සවිකිරීම සඳහා 2013 ජනවාරි 28 දින ලංකා විදුලිබල මණ්ඩලයට රු.31,297,567 ක් ගෙවා තිබුණි. 2015 ජූනි 05 වනවිට මුදල් ගෙවා අවුරුදු 02 මාස 04 ක් ඉක්මගොස් තිබුණද ඉන් රු.14,723,764 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් සපයා සවිකර නොතිබුණි.

(එ) ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය වෙත 2015 දෙසැම්බර් 12 දින ලැබුණු රු.4,495,000 ක් වටිනා INFUTIONPUMP 29 ක් නියමිත පිරිවිතර හා එකග නොවන බව දන්වා 2016 ජනවාරි 12 දින සැපයුම්කාර ආයතනය වෙත යවා තිබූ නමුත් 2016 ජූලි දක්වා පිරිවිතර වලට අනුකූල උපකරණ නැවත සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) මධ්‍යම පළාත් සභාවේ මහජන නියෝජිතවරියකගෙන් අයවිය යුතුව තිබූ රු.154,790 ක හිඟ ණය ශේෂය සම්පූර්ණයෙන් අයකර ගැනීමට කටයුතු නොකර 2013 ජූලි 02 දින මන්ත්‍රීධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පිළිගෙන තිබීම හේතුවෙන් අයකර ගතයුතුව තිබූ හිඟ ණය මුදල 2015 දෙසැම්බර් 31 දිනට රු.48,937 ක් විය.

(ඔ) වෙනත් ආයතන සතුව තිබුණු වාහන 26 ක් නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් පරිහරණය කරමින් පැවතියද ඒවායේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) පරිවාස නිලධාරීන් 14 දෙනෙකුට හා සංවර්ධන නිලධාරියකුට යුනිසෙෆ් ව්‍යාපෘතිය යටතේ යතුරු පැදි ලබාදී තිබුණද ඒවා ආපසු ලබා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකර ක්ෂේත්‍ර නිලධාරින්ට යතුරු පැදි ලබා දීමේ වැඩසටහන යටතේද නැවත වතාවක් එකී නිලධාරින්ට යතුරු පැදි ලබා දී තිබුණි.

(ක) උතුරු මාතලේ ආයුර්වේද රෝහලට 2015 වර්ෂය සඳහා ඉල්ලුම් කරන ලද වියළි ඖෂධ වර්ග අතරින් ඖෂධ වර්ග 12 ක් සම්පූර්ණයෙන්ම ලැබී නොතිබුණු අතර, ලැබී තිබූ වියළි ඖෂධ වර්ග අතරින් වර්ග 10 ක ලැබීම්, ඇනවුම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 13 සිට සියයට 45 දක්වා අවම මට්ටමක පැවතුණි.

(ග) පළාත් සභා මැති ඇමතිවරුන් සඳහා ලබා දෙනු ලබන ලැප්ටොප් පරිගණක යන්ත්‍ර ඔවුන් පළාත් සභා මන්ත්‍රී ධුරයෙන් ඉවත්ව යනවිට නැවත භාරදීමට කටයුතු කලයුතු වුවත්, 2016 මාර්තු 31 දින වනවිටද නැවත භාර නොදුන් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 26ක වටිනාකම රු.2,789,100ක් විය.

(ච) වලපනේ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් නිවාස 09 ක් සඳහා නිවාස කුලී අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ජ) මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ මාස 06 ත් වර්ෂ 02 ත් අතර කාලයක් තුළ පැවති රු.3,427,103 ක වටිනාකමකින් යුතු හානි පාඩු අය කරගෙන නොතිබුණි.

(ට) කොත්මලේ අධ්‍යාපන කලාපයේ පාසල් 85 ක ළමාමේස 4702 ක්, ළමාපුටු 5200 ක්, ගුරු මේස 517 ක් සහ ගුරු පුටු 640 ක ඌනතාවයක් පැවතිණි.

6.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි මහා සංගමයට දීර්ඝකාලීන බදු පදනම මත ලබාදී තිබූ ඉඩමේ පවත්වාගෙන යනු ලබන සමෘද්ධි සංගම් 03 කින් 2014 හා 2015 වර්ෂයන්ට අදාල රු.162,600 ක බදු මුදල් හා 2014 වර්ෂය වෙනුවෙන් වූ රු.8,130 ක දඩ මුදල් 2016 අප්‍රේල් වන විටද අයවී නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ පළාත් සංවර්ධන යෝජනා යටතේ මිලදීගත් රු.314,310 ක් වටිනා භාණ්ඩ අයිතම 101 ක් වර්ෂ 02 කට ආසන්න කාලයක් බෙදාහැරීමට කටයුතු නොකර විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ඈ) කලාප අධ්‍යාපන කාර්යාල 04 ක් යටතේ පවතින පාසල් වලට අදාලව 2011 වර්ෂයේ සිට 2015 දක්වා ලැබුණු පැමිණිලි 193ක් සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදුකිරීම සඳහා විමර්ශන මණ්ඩල පත්කර මාස 04 සිට වසර 04 ක කාලයක් ගතවී තිබුණද 2016 පෙබරවාරි වනතෙක්ම විමර්ශන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) දඹුල්ල හා පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල පිහිටි රජයේ ඉඩම් ස්වර්ණ භූමි හා ජය භූමි ඔප්පු මඟින් මහජනතාවට බෙදාදී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව එම ඉඩම් විකිණීමට, බැහැර කිරීමට හෝ අතුරු බදුදීමට හිමිකරුට කිසිදු අයිතියක් නොතිබියදීත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමකින් තොරව දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම සඳහා පුද්ගලික දුරකථන සමාගම් සඳහා අතුරු බදුදී තිබුණි.

(ඉ) ගලේවෙල අධ්‍යාපන කලාපයට අයත් පාසල් 85 ක ඉඩම් නිරවුල් කර මායිම් ලකුණු කර නොතිබුණු බැවින් පාසල් ඉඩම් වල අනවසර ඉදිකිරීම් හා අනවසර මාර්ග ඉදිකිරීම් වැනි විවිධ ගැටළු පැනනැගී තිබුණි.

(ඊ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ තොළඹුගොල්ල උසස් තාක්ෂණ පුහුණු ආයතනයේ ඉහල මහල ප්‍රතිසංස්කරණය සඳහා ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන සහ කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2015 නොවැම්බර් 30 දින කොන්ත්‍රාත්කරු වෙත රු.508,635ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ගෙවා තිබූ නමුත් නියමිත පරිදි වැඩ නිම නොවීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින රු.205,299ක මුදලක් ආපසු ලබා ගෙන කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(උ) වලපනේ හා නුවරඑළිය කලාප වල 1994 සිට 2014 දක්වා පත්වීම් ලැබූ ගුරුවරුන් 48 දෙනෙකුගෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කළද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංකයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) උකුවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල රජයේ ඉඩම් බුක්තිවිඳින්නන් සඳහා ලබාදීමට තිබූ ස්වර්ණභූමි හා ජයභූමි දීමනා පත්‍ර පිළිවෙලින් 12 ක් හා 198 ක් වර්ෂ 05 සිට වර්ෂ 33 දක්වා කාලයක් ගතවී තිබුණද ඒවා බෙදාදීමට කටයුතු කර නොතිබුණි.

(එ) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ කොන්ත්‍රාත්කරුවන් කිහිපදෙනෙකු ගෙන් අය කරගෙන තිබූ රු.279,559 ක එකතුකළ අගය මත බදු මුදල් මාස 25 ක කාලයක් දේශීය ආදායම් කොමසාරිස් වෙත නොයවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඒ) පුස්සැල්ලාව ප්‍රාදේශීය රෝහල විසින් 2015 වර්ෂයේ ඇස්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලද රු.1,046,595 ක් වටිනා ඖෂධ වර්ග 19 ක් ලැබී නොතිබූ අතර මහනුවර ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ රු.91,312ක් වටිනා ඖෂධ වර්ග 17ක් අතිරික්තව පැවතුනි.

(ඔ) සමස්ථ ලංකා පාසැල් ක්‍රීඩා තරඟ සඳහා සහභාගිවන පාසැල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ඇඳුම් කට්ටල 2,400 ක් ලබාදීමට මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රු.3,000,000 ක ප්‍රතිපාදන වෙන් කර ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා රු.2,925,000 ක වියදමක් දරා ක්‍රීඩා ඇඳුම් කට්ටල 3,000 ක්, ක්‍රීඩා තරඟ අවසන්වී දින 66 ක් හා දින 89 ක් ඉක්මගිය පසු අවස්ථා දෙකකදී මිලදී ගෙන තිබුණි. මිලදීගත් ඇඳුම් කට්ටල 179 ක් 2016 ජූනි 10 දින වනවිටත් බෙදා නොදී ගබඩාවේ රඳවා තිබුණි.

## 6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ හදිසි සංවර්ධන අවශ්‍යතා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝගී කරගෙන හදිසි සංවර්ධන අවශ්‍යතා වශයෙන් සැලකිය නොහැකි රු.985,680 ක් වූ අනු පිටපත් යන්ත්‍ර 02 ක් හා රු.141,525 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදීගෙන තිබුණු අතර, ඉන් එක් අනුපිටපත් යන්ත්‍රයක් අධ්‍යාපන කාර්යාලයක් වෙත ලබාදී තිබුණි.

(ආ) විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශයේ පවිත්‍රතා කටයුතු 2015 අප්‍රේල් 01 දින සිට කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය වෙත ලබා දී තිබූ අතර එය පෙර වර්ෂයේ මිල ගණන් හා සැසඳීමේදී කාර්යයන්ගේ කිසිදු වෙනසක් නොමැතිව වාර්ෂික වියදමෙහි රු.558,000ක වැඩිවීමක් විය.

(ඇ) මහවැලියෙන් පවරාගත් වත්කමක්සේ නොසැලකෙන කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට අයත් ජනසවිගම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම හා ඇවිදින මංතීරු සැකසීම සඳහා 2014 හා 2015 වර්ෂයන්වලදී වත්කම් නඩත්තු වැය විෂයය යටතේ රු.7,125,784 ක් හා තුලිත ආර්ථික සංවර්ධන ව්‍යාපෘති අරමුදලින් රු.3,290,127 ක් ද වශයෙන් එකතුව රු.10,415,911 ක් වැයකර තිබුණි. තුලිත ආර්ථික සංවර්ධන ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් මෙම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇතත් ව්‍යාපෘතියේ අරමුණට අනුගත නොවන බැවින් එකඟතාවය ලබාදිය නොහැකි බව දැනුම්දී තිබියදීත් මෙම වියදම දරා තිබුණි.

## 6.5 දෘශ්‍ය අක්‍රමිකතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හැටන් අධ්‍යාපන කළාපයට අයත් පාසලක ගුරුවරයෙකු විසින් බැංකු ණයක් ලබාගැනීම සඳහා ව්‍යාජ ලේඛන සකස් කිරීම සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව හා අදාල ලිපි ලේඛණ ලබාදෙන ලෙස මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් හැටන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලීම් කර තිබුණි. 2015 දෙසැම්බර් 04 දින වන විටත් එම වාර්තා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබාදී නොතිබුණු අතර ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.2 වගන්තිය ප්‍රකාරව එම නිලධාරීයාට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට කටයුතු නොකර 2015 මැයි මස සිට නොවැම්බර් මස දක්වා රු.344,666 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) හැටන් සීඩා මධ්‍යස්ථානයේ අවස්ථා 407ක දී අවිධිමත් ලෙස රැස්කර තිබුණු රු.2,631,800ක මුදලක් එම ස්ථානය භාර සම්බන්ධීකරන නිලධාරි විසින් ආදායමට බැරකර නොතිබුණි.

(ඇ) කටුගස්තොට කලාප කාර්යාලයට අනුයුක්තව සේවය කරන ඉංග්‍රීසි විෂය භාර වැඩ ආවරණය කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරිය 2015 ජූලි මස සේවයට වාර්ථා නොකර අනුමැතියකින් තොරව පෞද්ගලික පාසැලක පූර්ණ කාලීනව සේවයේ යෙදී තිබූ අතර කටුගස්තොට කලාප අධ්‍යාපන කාර්යාලයෙන් එම මාසයට රු.51,514 ක වැටුපක් ලබාගෙන තිබුණි. තවද මෙම නිලධාරිනිය අවස්ථා 24කදී බැහැර රාජකාරී ලෙස දක්වා තිබුණු ස්ථානවල සේවයට වාර්තා කොට නොතිබුණු බවද වැඩිදුරටත් අනාවරණය විය.

## 6.6 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යස්ථාන 05ක වියමින් පැවති රු.200,735ක් වටිනා වෝජ් වසරකටත් අධික කාලයක් තිස්සේ නිම කර නොතිබුණු අතර, මධ්‍යස්ථාන 09ක රු.223,499ක් වටිනා නූල් කිලෝ 265ක් වසර 2ත් 8ත් අතර කාලයක් තුල නිකුත් කර නොතිබුණි.

(ආ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ හිඳගල පේෂකර්ම මධ්‍යස්ථානයේ නූල් වර්ණ ගැන්වීම සඳහා කාර්මිකයින් තිදෙනෙකු සිටි අතර නූල් සුදු වර්ණ ගැන්වීම පමණක් මෙහිදී සිදු කර තිබුණි. 2015 වර්ෂයේදි මෙම මධ්‍යස්ථානය වෙත ලැබුණු නූල් කිලෝග්‍රෑම් 290ක් වර්ණගැන්වීම සඳහා දින 28ක් ගත වී තිබුණු අතර, ඔවුන්ගේ නිශ්ක්‍රීය කාලය දින 171ක් විය.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ පරීක්ෂාවට ලක් කළ මධ්‍යස්ථාන 09ක මහන මැෂින් 02 ක්, වයින්ඩින් යන්ත්‍ර 13 ක්, විවීමේ යන්ත්‍ර 27ක් සහ නූල් සැකසීමේ යන්ත්‍ර ඇතුළු යන්ත්‍ර 45 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 19 ක් වසර 08 ක පමණ කාලයක් ධාවනයෙන් ඉවත්කර කාර්යාල භූමියේ නිශ්කාර්යව රඳවා තිබුණි.

(ඉ) නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් රජයේ නිවාස 35 ක් පරිහරණය නොකර නිශ්කාර්යව පැවතුණි.

(ඊ) විදුලි බලය නොමැති ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය සෞඛ්‍ය වැඩසටහන යටතේ 2014 පෙබරවාරි මාසයේදි ලබා දී තිබූ ජෙනරේටරය වසර 02 ක පමණ කාලයක සිට නිශ්කාර්යව කාර්යාල පරිශ්‍රයේ තබා තිබුණි.

(උ) 2013 වර්ෂයේ සිට මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ නඩත්තු ඒකකය ක්‍රියාත්මක වී නොතිබුණ අතර, මේ හේතුවෙන් නඩත්තු ඒකකයේ උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඌ) නුවරඑළිය කලාපයේ පාසල් 156 ක, ගුණාත්මක යෙදවුම් සඳහා පෙර වර්ෂවලදී ලබා දෙන ලද මුදලින් රු.6,109,719 ක් 2015 ජනවාරි 01 වන විට වැය නොකර ඉතිරිව පැවති අතර සමාලෝචිත වර්ෂය තුල ලබා දි තිබූ රු.6,959,200 ක මුදලද ඇතුළුව රු.13,068,919 ක මුළු මුදලින් වර්ෂය තුල වැය කර තිබුණේ රු.2,826,284 ක් බැවින් 2015 දෙසැම්බර් 31 වනවිට රු.10,242,635 ක මුදලක් නිශ්කාර්යව පැවතිණි.

(එ) සමාලෝචිත වර්ෂයේ නුවරඑළිය කලාපයේ පාසල් 82 කට ගුණාත්මක යෙදවුම් සඳහා ලබා දී තිබුණු මුදලින් කිසිදු මුදලක් වර්ෂය තුල වැයකර නොතිබු අතර, 2015 දෙසැම්බර් 31 දිනට එසේ නිශ්කාර්යව පැවති මුදල රු.7,404,956 ක් විය.

(ඒ) 2015 වර්ෂය තුල වලපනේ කලාපයේ පාසල් 87 ක් සඳහා ගුණාත්මක යෙදවුම් ලෙස රු.3,369,400 ක් ලබා දි තිබු අතර පාසල් විසින් ඉදිරිපත් කර තිබු වාර්තා අනුව පාසල් 08 කට අදාලව රු.423,354ක මුදලක් භාවිත නොකිරීම නිසා නිශ්කාර්යව පැවතිණි.

(ඔ) වලපනේ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසැල් 3 ක් විවිධ හේතුන් මත වසා දමා තිබූ අතර, 2016 මාර්තු වන විටද එම පාසැල් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් නොගැනිම නිසා පාසල් ගොඩනැගිලි විනාශ වෙමින් පැවතුණි.

(ඕ) වලපනේ කලාප අධ්‍යාපන කාර්යාලයේ ජීප් රථයක් වසර ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන කාර්යාල භූමියේ රඳවා තිබුණි.

(ක) වලපනේ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ගුරු නිවාස 9 ක්, සාද නිවාස 07 ක් හා විදුහල්පති නිවාස 02 ක් කිසිදු ගුරුවරයකු පදිංචි නොවීම නිසා නිශ්කාර්යව පැවතුණි. තවද ගුරු නිවාස 07 ක් හා විදුහල්පති නිවාස 05 ක් පදිංචි වීමට නොහැකි ලෙස අබලන් තත්ත්වයේ පැවතුනි.

(ග) අංකුඹුර ප්‍රාදේශීය රෝහලට අයත් නිල නිවාස 04 ක වහල අබලන් තත්ත්වයේ පවතින බැවින් දීර්ඝ කාලයක සිට කිසිදු නිලධාරියෙකුගේ පදිංචිය සඳහා භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුනි.

## 6.7 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාසල් පාදක කළමනාකරණය හා පාසල් පාදක ගුරු සංවර්ධනය පිළිබඳ තායිලන්තය හා පිලිපීනය යන රටවල පැවති ගුරු පුහුණු වැඩමුළුව සඳහා ගුරු පුහුණුවට ඍජුවම සම්බන්ධ පූර්ව අත්දැකීම් ඇති නිලධාරීන් සහභාගි කරවීම වෙනුවට එම ව්‍යාපෘතියට සම්බන්ධ වෙනත් නිලධාරීන් 23 ක් සහභාගි කර ඒ සඳහා රු.24,230,725 ක් ව්‍යාපෘති (TSEP) අරමුදලින් වැය කර තිබුණි.

(ආ) කාමර 3 කින් යුත් නිවාස 3 ක් මන්ත්‍රීවරුන්ගේ නවාතැන් පහසුකම් සඳහා වෙන්කර තිබියදී 2016 අයවැය සම්මත කිරීමේ විවාදය පැවති දිනයේදී මන්ත්‍රීවරුන්ගේ නවාතැන් පහසුකම් සඳහා පෞද්ගලික හෝටලයක් වෙත රු.134,000 ක් හා සුභපැතුම් පත් මුද්‍රණය සඳහා රු.19,000 ක් මධ්‍ය පළාත් සභා ලේකම් කාර්යාලය විසින්ද සුභපැතුම් පත්, සමරු තිළිණ හා අටපිරිකර මිලදී ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.425,190 ක් වශයෙන් රු.578,190 ක් වැයකර තිබුණි.

## 6.8 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බෙරවටස් රාජකීය ප්‍රාථමික පාසැලේ විදුහල්පති විසින් 2014 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුලත් කිරීමේදී එක් සිසුවකුගෙන් රු.12,500 බැගින් රු.1,594,600 ක් අයකර ගෙන පාසැලේ ආදිශිෂ්‍ය සංගම් ගිණුමේ තැන්පත්කර තිබුණි. විදුහල්පති විසින් පාසැලේ අවශ්‍යතාවන් දක්වා වරින් වර එම මුදල් ලබාගෙන තිබුණත් වියදම් කළ ආකාරය සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. තවද 2015 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කර ගැනීමේදී අමාත්‍යාංශ ලේකම්ගේ අවසරයකින් තොරව රු.751,600 ක් පාසැල් සංවර්ධන සමිති ගිණුමට රැස්කර තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව මධ්‍යම පළාත් සභා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අයිතිෂණ මන්ත්‍රීවරුන් 07 දෙනෙකු සඳහා මසකට රු.12,000ක උපරිමයකට යටත්ව 2015 වර්ෂය සඳහා රු.1,013,220ක දීමනාවක් ගෙවා තිබුණි.

## 6.9 අරමුණුවලට පටහැනි ගෙවීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා පෙර සූදානම් ඒකකය මගින් 2014 දෙසැම්බර් 29 වන දින සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලද රු.500,000 ක අත්තිකාරම් මුදල් අදාල කටයුතු සඳහා වියදම් නොකර වර්ෂයක කාලයකට පසු රු.499,952 ක මුදලකට වැහිකබා, ආවරණ සපත්තු, ඒවා ඇසිරීම සඳහා බෑග් හා LED විදුලි පන්දම් මිලදී ගෙන තිබුණි.

(ආ) උපමාන පාදක ප්‍රදාන යටතේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංවර්ධන යෝජනා සඳහා වෙන්කළ ප්‍රතිපාදන වලින් එම අරමුණට පටහැනි වැඩසටහන් 04 ක් සඳහා රු.175,000ක් ගෙවීම්කර තිබුණි.

(ඈ) මධ්‍යම පළාත් විදුහල්පතිවරුන් විසින් 2011 අගෝස්තු 30 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා අතර කාලය තුළ පළාත් විභාග ගිණුමට බැර කර තිබූ රු.797,360 ක මුදල අදාල කාර්යය සඳහා යොදවා නොතිබුණි. 2015 වර්ෂයේ මාර්තු හා අප්‍රේල් වනතෙක් වසර 3 ½ කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබූ මෙම මුදලින් අරමුණට පටහැනි ප්‍රාග්ධන ගණයේ භාණ්ඩ ලබා ගැනිම සඳහා රු.791,110 ක් වැයකර තිබුණි.

## 6.10 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විදුලි පද්ධතිය නවීකරණය කිරීම සඳහා අධියර තුනක් යටතේ රු.10,746,752 ක් වැය කිරීමෙන් අනතුරුව එහි නඩත්තු කාලය ඉක්මයාමට මත්තෙන් නවීකරණය කළ විදුලි පද්ධතියේ කාර්මික දෝෂයක් සිදු වී තිබුණි. එම හේතුවෙන් දෙපාර්තමේන්තුවට අයත් ඡායා පිටපත් යන්ත්‍ර, ලැප්ටොප් පරිගණක, ෆැක්ස් යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර වැනි වටිනා විදුලි උපකරණ ඒකක 38ක් ක්‍රියා විරහිතවී හානියට පත්ව තිබුණද ඒ පිළිබඳ සොයා බලා එම අලාභය වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව බදු මුදල් අය නොකිරීම නිසා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පුද්ගලික සමාගමක් වෙත 2001 වර්ෂයේදී ලබාදී තිබූ ඉඩමකින් රු.5,053,630 ක බදු මුදලක් අඩුවෙන් අයකර තිබුණි.

(ඇ) ගලේවෙල කලාපයේ පැල්වෙහෙර කණිෂ්ඨ විද්‍යාලයේ 2012 වර්ෂයේ සිදු වූ පරිගණක සොරකම සම්බන්ධයෙන් වූ මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාව අනුව නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකරගත යුතු රු.99,781 ක මුදල 2015 දෙසැම්බර් මාසය දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඈ) ගලේවෙල කලාපයේ පාසල් 03 ක සිදුවූ අලාභ සම්බන්ධයෙන් 2012 මැයි මාසයේ විශ්‍රාම ගිය විදුහල්පතිවරයෙකුගෙන් අයකර ගතයුතු අධිභාර මුදල රු.614,170 ක් බව තීරණය කර ඇතත්, එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) නුවරඑළිය ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ රු.2,777,125 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ අයිතම 242 ක් පැවතුණි.

(ඊ) නුවරඑළිය ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ පැවති රු.5,709,061 ක් වටිනා ඌන ප්‍රමිතියෙන් යුතු ඖෂධ තොග සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) නුවරඑළිය ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශය විසින් වට්ටම් කාලසීමාව තුළ ගෙවීම් නොකිරීම හා අදාළ වට්ටම් අඩුකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වරිපනම් බදු ගෙවීමේදී රු.106,292 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඌ) මාතලේ දිස්ත්‍රික් වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා තුළ හා රෝහල් ගබඩාවල 2011-2014 දක්වා වර්ෂවල සිට පැවත එන පිළිවෙලින් රු.4,743,459 ක් හා රු.5,664,627ක් වශයෙන් එකතුව රු.10,408,086 ක් වටිනා ප්‍රමිතියෙන් තොර ඖෂධ විශාල ප්‍රමාණයක් පැවතුණි.

(එ) පුස්සැල්ලාව, පට්ටිය පල්ලේගම හා උඩගම අටහාගේ යන ප්‍රාදේශීය රෝහල්වල රු.77,270 ක් වටිනා ඖෂධ වර්ග 22 ක් කල් ඉකුත්වී තිබුණි.

(ඒ) මහනුවර ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ රු.4,021,310 ක් වටිනා ඖෂධ වර්ග 80 ක ඌනතාවයක් පැවතුණි.

(ඕ) වලපනේ අධ්‍යාපන කලාපයේ පාසැල්වල 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සේවය හැරගිය ගුරුවරුන් 03 දෙනෙකු සඳහා සේවය හැර යාමෙන් පසුවද රු.64,661 ක වැටුප් හා දීමනා ගෙවා තිබු අතර, වගකිවයුතු නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඖ) ප්‍රධාන තක්සේරුකරුගේ 2014 ජූලි 16 දිනැති ලිපිය අනුව නුවරඑළිය යුනික්වීව් නමැති රජයේ නිවස සහිත ඉඩම 2005 වර්ෂයේ දී රු.14,000,000 ක් වශයෙන් හා 2014 වර්ෂයේදී රු.23,000,000 ක් ලෙස තක්සේරු කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අයවිය යුතු බදු කුලිය රු.5,600,000 ක් වුවද ඒ සඳහා අයකර තිබුණේ රු.162,000 ක් වූ ආර්ථික කුලියක් පමණි. නිසි පදනමකින් තොරව අයකර තිබු මෙම ආර්ථික කුලිය හේතුවෙන් මධ්‍යම පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට රු.5,438,000 ක අලාභයක් සිදුව තිබුණි.

(ක) ගුරුදෙණිය අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේ වේදිකාවට කාපට් ඇතිරීම වෙනුවෙන් වර්ග අඩි 783 කට ගෙවීම් කර තිබුණද ඉටුකර තිබුණේ වර්ග අඩි 712 ක්වීම හේතුවෙන් වර්ග අඩි 71 වෙනුවෙන් රු.55,593 ක්ද, පවිත්‍රතා සේවය ලබාගැනීමේදී ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව ගෙවීම් කර තිබීම නිසා රු.9,000 ක්ද වශයෙන් එකතුව රු.64,593 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ග) ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය වෙත 2016 ජුනි 08 දින ලැබුණු රු.1,524,000 ක් වටිනා රුධිර පීඩන මාපක 254 ක් රෝහල් 42 ක් වෙත බෙදාදීමෙන් අනතුරුව ඒවායේ මිනුම් වැරදි ලෙස පෙන්නුම් කිරිම හේතුවෙන් භාවිතයට ගත නොහැකිවී තිබුණි.

(ච) නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහල වෙත ලබා දි තිබු රු.1,200,000 ක් වටිනා Blood gasanalaizer යන්ත්‍රය වගකීම් කාලය ඉක්මවීමට මත්තෙන් එනම් මාස 03 ක කාලයකට පසුව අක්‍රිය වී තිබුණි.

6.11 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වාර්ෂික ඇස්තමේන්තුවෙන් කෘෂි මාර්ග සංවර්ධනය සඳහා සලසා තිබුණු රු.7,000,000ක ප්‍රතිපාදන වලට අදාළ මුදල පලුටුවාව මාර්ගය වැඩි දියුණු කිරිම හා නුවරඑළිය ගල්පාලම පුහුණු මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දින පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. නමුත් එම ඉදිකිරිම් කර ඇති බවට 2016 අප්‍රේල් 26 වෙනි දින වන විටද පළාත් අමාත්‍යාංශය විසින් සනාථ කරගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් කොත්මලේ දොරගල ගම්මානය පාංශු සංරක්ෂණ ආදර්ශ ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 17.85 ක ප්‍රතිපාදන යටතේ ජල වහන පද්ධති, කෘෂි මාර්ග, වැසි ජල රැඳවුම් ස්ථාන,ක්ෂුද්‍ර වාරි පද්ධති, පලතුරු වතු, මල් හා බිම්මල් වගාවන් සහ පාංශු සංරක්ෂණ උපාය මාර්ග ආදිය ඇතුළත් සැලැස්මක් 2015 අගෝස්තු මාසයේදී පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. නමුත් සම්පූර්ණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම නිසා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එයින් රු.මිලියන 7.5 ක ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් නව සැලැස්මක් අනුමත කරගෙන තිබීම හේතුවෙන් පළාතට ලබා ගත හැකිව තිබුණු රු.මිලියන 10.35 ක ස්වභාවික සම්පත් සංරක්ෂණ ක්‍රියාකාරකම් අහිමි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ නිමකළ යුතු ඇස්තමේන්තුගත පිරිවැය රු.2,263,059 ක් වු කාර්යයන් 07 ක් 2016 මාර්තු 09 දින වන විටත් නිමකර නොතිබුණි.

(ඇ) මල්දෙණිය දිස්ත්‍රික් රෝහලේ මානසික සෞඛ්‍ය වෛද්‍ය ඒකකය අලුත්වැඩියා කිරීම සඳහා රු.1,808,405 ක මුදලක් වැය කලද කානු පද්ධතියේ දෝෂයක් හේතුවෙන් වැහි කාල වලදී වාට්ටුව ජලයෙන් යටවීම නිසා එය ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ රු.2,057,560 ක් වැය කර මල්දෙණිය දිස්ත්‍රික් රෝහල සඳහා ඉදිකළ හදිසි ප්‍රතිකාර ඒකකයේ බිත්ති, කොන්ක්‍රීට් කුළුණුවලින් වෙන්වී ඉරිතලා ගොස් තිබුණු අතර ඉහළ මාලයට පිවිසීම සඳහා යොදා ඇති පඩි පෙල ප්‍රමිතියෙන් තොර බව නිරීක්ෂණය විය.

6.12 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු රු.348,500 ක ප්‍රතිපාදන, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් ලැබී තිබූ රු.89,000 ක ප්‍රතිපාදන හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් ලැබී තිබූ රු.293,000 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විදුලි හා ජල ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.125,678 ක් හා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විදුලි දිගු 02 ක් වෙනුවෙන් රු.122,928 ක් වශයෙන් එකතුව රු.248,606 ක මුදලක් වැයකර තිබුණද 2016 පෙබරවාරි වනවිටද විදුලි හා ජල සම්බන්ධතා ලබාදී නොතිබුණි.

(ඇ) උඩුනුවර වේරලවත්ත ප්‍රදේශයේ ගැහැණු ළමයින් සඳහා රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම වෙනුවෙන් රු.10,139,232 ක් වැය කර තිබූ අතර ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා නිර්දේශිත ස්ථානයෙන් බැහැරව හා පස් සාම්පල පරීක්ෂාවකින් තොරව බැවුම් සහ මඩ සහිත කුඹුරු යායක් ආසන්නයේ ඉදිකිරීම හේතුවෙන් ගොඩනැගිල්ල සහ ආරක්ෂිත බැම් පුපුරා ගිලාබැස ගොස් අනාරක්ෂිත තත්ත්වයට පත් ව තිබුණි. නිර්දේශිත ස්ථානයෙන් බැහැර වීම නිසා ආරක්ෂිත බැම් ඉදි කිරීමට අමතරව දරන ලද රු.1,369,295 ක මුදලක් ද ඉහත වියදමට ඇතුළත්ව තිබුණි. වසරකට අධික කාලයක් තිස්සේ මෙම ගොඩනැගිල්ල රැඳවුම් මධ්‍යස්ථානයක් ලෙස උපයෝජනය කර නොතිබුණි.

(ඈ) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 16.64 ක් වූ උප වාරි ව්‍යාපෘති 11 ක් හා මිරිදිය ධීවර වැඩසටහන සහ පරිසර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.2,050,000 ක් වූ උප ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත්කර නොතිබුණු ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.19,070,000 ක් වූ වාරි ව්‍යාපෘති 32 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබුණි.

6.13 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

6.13.1 <u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

2015 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල සේවක සංඛ්‍යාව

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 2,062 | 1,513 | 578 | 29 |
| තෘතීයික මට්ටම | 770 | 915 | 183 | 263 |
| ද්විතීයික මට්ටම | 9,673 | 6,578 | 3,332 | 302 |
| ප්‍රාථමික මට්ටම | 4,628 | 4,158 | 1,389 | 919 |
| කොන්ත්‍රාත් පදනම මත | 13 | 01 | 12 | - |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 204 | - | 204 |
| එකතුව | 17,146 | 13,369 | 5,494 | 1,717 |

(ආ) පාසැල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු/ නියෝජ්‍ය විදුහල්පතිවරු | 1,491 | 1,570 | - | 79 |
| ගුරුභවතුන් | 24,818 | 21,482 | 3,336 | - |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 2,285 | 1,885 | 400 | - |
| | 28,594 | 24,937 | 3,736 | 79 |

(ඇ) පළාත් පාලන ආයතන

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 93 | 74 | 21 | 02 |
| තෘතීයික මට්ටම | 118 | 74 | 44 | - |
| ද්විතීයික මට්ටම | 2,025 | 1,511 | 550 | 36 |
| ප්‍රාථමික මට්ටම | 3,879 | 4,415 | 421 | 957 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 154 | - | 154 |
| එකතුව | 6,115 | 6,228 | 1,036 | 1,149 |

(ඈ) <u>ප්‍රඥප්ති මඟින් පිහිටවූ ආයතන</u>

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 03 | 01 | 01 |
| ද්විතීයික මට්ටම | 05 | 03 | 02 | - |
| ප්‍රාථමික මට්ටම | 05 | - | 05 | - |
| අනියම්/කොන්ත්‍රාත් | 09 | 06 | 03 | - |
| එකතුව | 21 | 12 | 11 | 01 |
| | == | == | == | == |

කාර්ය මණ්ඩල පරිපාලනය පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා පළාත් සභා තනතුරු 06 කට අදාළව නිලධාරීන් 06 දෙනෙකු අනුමතව පැවතියද, වර්ෂය පුරාම එම තනතුරු පුරප්පාඩුව පැවතුණි.

(ii) ප්‍රාථමික උප ගුරු තනතුරකට පත්ව වලපනේ කලාපයේ විද්‍යාලයන්හි සේවය කළ ගුරුවරයෙකුට පළාත් සභා අමාත්‍යවරයකුගේ මහජන සම්බන්ධීකරණ නිලධාරි තනතුර ලබාදී තිබූ අතර කලාපයේ ප්‍රාථමික අධ්‍යාපන ගුරු පුරප්පාඩු 57 ක් පැවතියදි වසර 11 කට අධික කාලයක් මෙම ගුරුවරයා ගුරු සේවයෙන් මුදා හැර 2005 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා රු.2,943,421 ක ගුරු වැටුප් ගෙවා තිබුණි.

(iii) 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව පහසු පාසලක උපරිම සේවා කාලය වසර 08 ක් ද, වඩාත් පහසු පාසලක උපරිම සේවා කාලය වසර 06 ක්ද ලෙස දක්වා තිබුණි. නමුත් කලාප 03ක ගුරුවරුන් 430 දෙනෙකු වසර 08 සිට වසර 36 දක්වා කාල පරාසයක් තුල එකම පාසලක සේවය කරමින් තිබූ අතර, එයින් 80 දෙනෙකු මුල් පත්වීම් ලැබූ පාසලේ මේ දක්වාම සේවය කරමින් තිබුණි.

(iv) 2003 දෙසැම්බර් 02 දිනැති අංක 04/03 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ vi වන වගන්තිය ප්‍රකාරව පුරප්පාඩු තනතුරු සඳහා වැඩ බැලීම හා වැඩ ආවරණය කිරීමට පත් කිරිම සම්මුඛ පරීක්ෂණයක් මගින් පළාත් බලධාරියා විසින් කළයුතු විය. නමුත් කලාප 04 කට අයත් පාසැල් 94 ක වසර 02 සිට වසර 25 ක් දක්වා කාලයක සිට පුරප්පාඩු වී පවතින විදුහල්පති සේවයේ තනතුරුවල වැඩ බැලිම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් පළාත් අධ්‍යාපන ලේකම්වරයා විසින් පත්කර තිබූ බව නිරීක්ෂණය විය.

(v) 2000 ජුනි 30 දිනැති අංක 2000/02 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ චක්‍රලේඛය ප්‍රකාර නියෝජ්‍ය අධ්‍යාපන හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට කරනු ලබන පත්වීමක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය මත පමණක් සිදුකළ යුතු විය. එම විධිවිධාන වලට පටහැනිව නුවරඑළිය හා හැටන් අධ්‍යාපන කලාපවල ශ්‍රී ලංකා ගුරු සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තනතුරු දරන ගුරුභවතුන් 21 ක් එම තනතුරු සඳහා පළාත් අධ්‍යාපන ලේකම්වරයා විසින් පත්කර තිබුණි.

(vi) ප්‍රධාන අමාත්‍ය කාර්යය මණ්ඩලය තුළ තනතුරු 06 ක නිලධාරීන් 18 ක් අතිරේකව සිටි අතර ඔවුන් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන වලින් දරා තිබූ වැටුප් හා දීමනාවලට අමතරව ඔවුන් අනුයුක්ත කර ගත් ස්ථිර සේවා ස්ථාන 05 කින් ද රු.2,315,315 ක් එම නිළධාරීන්ට ගෙවා තිබුණි.

(vii) කොත්මලේ කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව 18 ක් වුවද 26 දෙනෙකු සේවයේ යෙදී සිටි අතර පුරප්පාඩු තිබෙන ස්ථාන හඳුනාගෙන ඔවුන්ව සේවයේ යෙදවීමට කටයුතු කර නොතිබුණි. නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලයට අනුමත සංවර්ධන නිලධාරීන් සංඛාව 09 ක් වුවත් 24 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. හැටන් කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සංවර්ධන නිලධාරීන් 21 දෙනෙකු සඳහා 2015 ජනවාරි 01 දින සිට 2015 සැප්තැම්බර් 30 දක්වා වැටුප් වශයෙන් රු.6,588,642 ක් ගෙවා තිබුණි.

(viii) ගලේවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යාපනයට ඍජුවම බලපාන අතිරේක කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ,සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හා පාසල් පරීක්ෂක යනාදි තනතුරු 04ක පුරප්පාඩු 63 ක් පැවති අතර සුදුසුකම් නොමැති නිලධාරීන්ගෙන් එකී තනතුරුවල රාජකාරි ආවරණය කර තිබුණි.

(ix) ගලේවෙල අධ්‍යාපන කලාපය තුළ ගුරු තුලනය සිදුකර නොතිබීම නිසා විෂයයන් 10 කට අදාළව ගුරු පුරප්පාඩු 173 ක් හා විෂයයන් 07 කට අදාළව ගුරු අතිරික්තතා 111 ක් පැවතුණි.

(x) ගලේවෙල අධ්‍යාපන කලාපය තුළ වාර්ෂික ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම පාසලේ බොහෝ කාලයක් සේවය කරන ගුරුවරු මෙන්ම, දුෂ්කර පාසල් වල ගුරු ඌනතාවයක්ද, ජනප්‍රිය පාසල් වල ගුරු අතිරික්තයක්ද විය.

(xi) කලාප අධ්‍යාපන කාර්යාල 03කට අයත් පාසල් වල 1997 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පත්වීම් ලැබූ ගුරුවරුන් 93 දෙනෙකුගේ පරිවාස කාලය සම්පූර්ණ වි ඇති නමුත් විවිධ හේතූන් මත සේවය ස්ථිර කර නොතිබූ අතර ආයතන සංග්‍රහයේ ii වන පරිච්ඡේදයේ 11.2.3 විධිවිධාන ප්‍රකාරව පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම අවසන් කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(xii) බොහෝ පළාත් පාලන ආයතනවල කම්කරුවන් හා සුළු සේවකයින් අදාළ කාර්යයන් සඳහා යොදවා නොගෙන කාර්යාල පරිශ්‍රයේ කළමනාකරණ සහකාර හා සමගාමී තනතුරුවලට අදාළ කාර්යය භාරයන්හි යොදවා තිබුණි.

6.14 වාහන පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 සිට 2015 දක්වා වූ වසර 03 තුල ප්‍රධාන අමාත්‍යාංශය යටතේ වූ වාහන අනතුරු 06 ක් හේතුවෙන් සිදුවූ අලාභය 2015 දෙසැම්බර් 31 දිනට රු.5,918,796 ක් වූ අතර රක්ෂණ හිමිකම් වශයෙන් රු.1,410,736 ක් ලැබී තිබුණි. රක්ෂණයෙන් ආවරණය නොවූ රු.4,508,060 ක් වූ අලාභය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මාර්ග සංවර්ධන ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ වාහනයක් 2015 ජුලි 08 දින අනතුරකට භාජනය වීමෙන් පසු සිදු කළ අලුත්වැඩියාවේදී 2015 ජුලි 15 දිනැති අංක 38 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව රු.139,622ක මුදලක් ගෙවා තිබුණු අතර රු.506,183ක් වටිනා අමතර කොටස් 14ක් වාහනයට අලුතින් යෙදූ බව දක්වා තිබුණද පැරණි අමතර කොටස් ආපසු භාරගත් බවට ලිඛිත සාක්ෂි නොතිබුණි.

6.15 බැංකු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ආයතන 12 ක බැංකු ජංගම ගිණුම්වලට අදාලව ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ එකතුව රු.35,643,209 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඈ) විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

6.16 පළාත් පාලන බල මණ්ඩල කටයුතු අධීක්ෂණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. පළාත් පාලන බල මණ්ඩල ගිණුම් විගණනයේදී අනාවරණය වී ඇති කරුණු පළාත් පාලන බල මණ්ඩල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කර තිබු නමුත් ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව මධ්‍යම පළාතේ පළාත් පාලන බල මණ්ඩල 43න් මණ්ඩල 42 ක හිඟ ආදායම රු.1,074,439,141 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණකාධිපතිවරයා විසින් 2011 සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව මහනුවර, මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් හි පළාත් පාලන ආයතන 07 කට අදාළව නීතියට පටහැනිව කළ ගෙවීම් හා නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදුවූ පාඩු හේතුවෙන් රු.11,939,158 ක අධිභාර සහතික 21 ක් නිකුත් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | | අධිභාර සහතික සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| මහනුවර | | 01 | 136,466 |
| මාතලේ | | 11 | 11,102,692 |
| නුවරඑළිය | | 09 | 700,000 |
| එකතුව | 21 | == | 11,939,158 |
| | | | ======== |

(ඈ) නුවරඑළිය මහා නගර සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේ දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී අනාවරණය වී ඇති රු.423,631ක මුදල් ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 19කදී ලබාදුන් රු.2,226,476ක අත්තිකාරම් 2016 ජනවාරි 20 දින වන විටද පියවා නොතිබුණි.

(iii) අවසානයට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2013 ජූනි සිට 2015 පෙබරවාරි දක්වා නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06ක් කල් ඉකුත් වූ රු.139,571ක් වටිනා චෙක්පත් 38ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි.

(iv) මහා නගර සභා ආඥා පනතේ 40 (1) (ඊ) වගන්තියට පටහැනිව මහා නගර සභාව විසින් 1985 සිට 1995 දක්වා අවස්ථා 30කදී විෂයභාර අමාත්‍යවරයාගේ සහ ජනාධිපතිවරයාගේ අනුමැතියකින් තොරව ඉඩම් බදුදී තිබුණි.

(v) මහා නගර සභා ආඥා පනතේ 237 (1) වගන්තියට පටහැනිව මහා නගර සභාව 2000 වර්ෂයේ වත්කම් තක්සේරුවෙන් පසු වාර්ෂික වටිනාකම් බලපැවැත්වෙන භෞතික වෙනස්කම් සිදුකරන අවස්ථාවලදී නව තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි.

(vi) සභාවේ අංශ හතරක 338 දෙනෙකුගේ සේවක අතිරික්තයක් පැවතියදීත් සමාලෝචිත වර්ෂය තුල අතිකාල දීමනා වශයෙන් රු.8,298,955 ක් ගෙවා තිබුණි.

## 7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 අභ්‍යන්තර විගණනය

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන වැඩසටහන් රජයේ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 7.2 විගණන හා කළමනාකරණ කමිටු

පළාත් සභාවේ ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

### 7.3 ප්‍රසම්පාදන සැලැස්ම

(අ) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් පාසැල් හා කාර්යාල සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.මිලියන 129.38 ක ඇස්තමේන්තු මුදලක් සහිතව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබූ නමුත් ඉන් රු.මිලියන 96.38 ක් වූ භාණ්ඩ මිලදී ගෙන නොතිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ඇස්තමේන්තු ගත මුළු මූලධන වියදම රු.844,420,000 ක් වුවද ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුනේ රු.52,500,000 ක් සඳහා පමණි.

(ඇ) රු.මිලියන 10 වැඩි භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය යටතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ගිවිසුම්වලට එළඹි අවස්ථා 03 කදී රු.41,113,800 ක් වටිනා ශල්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි

### 7.4 විගණකාධිපතිවරයාගේ වාර්තා සභාගත කිරීම

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කල දිනය | සභාගත කල දිනය |
|---|---|---|
| 2010 | 2011.12.30 | 2013.04.23 |
| 2011 | 2013.03.28 | 2015.09.08 |
| 2012 | 2014.07.04 | 2016.02.16 |
| 2013 | 2015.01.07 | 2015.05.05 |
| 2014 | 2015.10.08 | 2015.11.03 |

### 7.5 පාරිසරික හා සමාජමය වගකීම් ඉටුකිරීම

හරිත නගර වැඩසටහන යටතේ පළාත් පාලන ආයතනවලට කොම්පොස්ට් බඳුන් ලබාදීමට කර තිබූ සැලසුමකට අනුව පළාත් පාලන ආයතන 02 කින් 2014 නොවැම්බර් මාසයේ දී රු.297,000ක දායකත්ව මුදලක් ලබාගෙන තිබුණි. වසරකට වැඩි කාලයක් එම මුදල් තැන්පත් ගිණුමක රදවා ගෙන තිබුණද ඊට අදාළ කොම්පෝස්ට් බඳුන් 250 සැපයීමට කටයුතු කර නොතිබුණි.

8. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් කළමණාකරණය

(ඈ) පළාත් සභා සංවර්ධන සැලැස්ම

(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය

(ඊ) සේවක මණ්ඩල පරිපාලනය